**නින්දවූර් ප්‍රාදේශීය සභාව**
**අම්පාර දිස්ත්‍රික්කය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 අප්‍රේල් 04 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, ඒ පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 19 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට නින්දවූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල 2015 මාර්තු 01 දින සිට සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රාදේශීය කාර්යාලයට රු.15,000 ක් වන මාසික කුලියකට ලබා දී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හිඟහිටව පැවති මාස 39ක් දක්වා කුලී මුදල් රු.585,000 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට 2016 වර්ෂ අවසානය දක්වා සභාවේ JCB වාහනය ක්ෂේත්‍ර වැඩ සඳහා පුද්ගලික පාර්ශවයන්ට කුලියට ලබාදීමෙන් ලැබිය යුතු රු.530,820 ක කුලිය ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) විවිධ වැඩසටහන් මගින් මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා ලබාදී තිබූ රු. 6,065,258ක් ගිණුම්ගත කර නොතිබුණි.

#### 1.3.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ස්ථාන මාරු වී ගිය සහ සේවය හැරගිය සේවකයින් 24 දෙනෙකුට ප්‍රාදේශීය සභාව විසින් ලබාදී තිබූ ණයවල හිඟහිටි ශේෂය රු.104,918 ක් වර්ෂ 10 කට අධික කාලයක සිට අයකර ගැනීමට කටයුතු නොකර අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

(ආ) වීථි ලාම්බු විදුලිය පරිභෝජනය වෙනුවෙන් ලංකා විදුලිබල මණ්ඩලයට ගෙවිය යුතු විදුලිය පරිභෝජන ගාස්තු රු.2,951,150 ක් සහ ලංකා විදුලිබල මණ්ඩලයෙන් ලැබිය යුතු රු. 2,477,322ක් ආදිය ගෙවීමට හා අයකර ගැනීමට කටයුතු නොකර වර්ෂ 22 කට අධික කාලයක සිට අඛණ්ඩව මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර තිබුණි.

**1.3.3 නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි ආදියට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | 1987 වර්ෂයේ අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 12(1) සහ (2) වගන්ති | -- | ප්‍රාදේශීය සභාවල කාර්යයන් පහසු කිරීමේ අරමුණෙන් නිවැරදි තීරණ ලබාගැනීම සඳහා මූල්‍ය හා ප්‍රතිපත්ති සැලසුම් කිරීම, නිවාස ඉදිකිරීම සහ සමාජ සංවර්ධනය, තාක්ෂණික සේවාවන්, පරිසර හා පොදු උපයෝගිතා සේවා යනාදී කර්තව්‍යයන් සඳහා වෙනම කණ්ඩායම් ස්ථාපිත කර ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | 1988 වර්ෂයේ ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීතියේ I පරිච්ඡේදයේ 5 (XII) වගන්තිය | -- | මුදල්, ගබඩා භාණ්ඩ සහ චෙක්පත්වල අත්සන් තැබීම ආදිය නිලධාරීන් තිදෙනෙකුට පරිපාලනමය වශයෙන් පවරා දී තිබුණත්, ඔවුන්ගෙන් ආරක්ෂිත ඇප ලබාගෙන නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571 | 1,541,743 | වර්ග 03කට අයත් තැන්පතු 57ක් වර්ෂ 02ක් ඉක්ම වූ ඉකුත් තැන්පතු වශයෙන් දක්නට ලැබුණත්, සභාව අදාල පුද්ගලයින්ට ආපසු ලබාදීමට හෝ ආදායම් ගිණුම්වලට මාරු කිරීමට හෝ කටයුතු කර නොතිබුණි |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.396,368 ක් විය. එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,731,248ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ රු.9,127,616ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි.

**2.2 ආදායම් පරිපාලනය**

**2.2.1 ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම් හා හිඟ ආදායම**

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට ආදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම, බිල්කළ ආදායම, රැස්කළ ආදායම හා හිඟ ආදායම පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 | රු.000 |
| (i) | වරිපනම් හා බදු | 6,250 | 4,424 | 3,377 | 3,338 | 6,250 | 4,300 | 3,749 | 2,291 |
| (ii) | කුලී | 5,125 | 3,070 | 3,039 | 3,275 | 5,125 | 7,585 | 7,542 | 3,244 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,525 | 649 | 649 | - | 1,525 | 957 | 957 | - |
| (iv) | වෙනත් ආදායම් | 8,500 | 7,605 | 7,277 | 3,178 | 8,500 | 8,501 | 8,128 | 2,850 |

**2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය**

2017 දෙසැම්බර් 31 දින දක්වා සභාව විසින් අයකර ගතයුතු ආදායම් රු.24,133,219 කින් සමාලෝචිත වර්ෂයේදී රු.14,341,938 ක් අයකරගෙන තිබුණි. මේ අනුව, ආදායම් රැස්කිරීමේ ප්‍රතිශතය 59% ක් වශයෙන් දක්නට ලැබුණි.

**2.2.3 මස් කඩ බදු මුදල් අයකිරීම**

1980 සිට 2012 වර්ෂ අවසානය දක්වා හිඟ හිටව පැවැති රු.3,173,466 ක මස් කඩ බදු මුදල් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගෙන නොතිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

#### 3.1.1 තිරසර සංවර්ධන අරමුණු (SDG)

2017 වර්ෂයේ අංක 19 දරන ශ්‍රී ලංකා තිරසර සංවර්ධන පනත 2030 වර්ෂය සඳහා එක්සත් ජාතීන්ගේ සංවිධානයේ තිරසාර සංවර්ධන වැඩසටහනට අනුකූලව සෑම ආයතනයක්ම ක්‍රියාකළ යුතුය. එසේ වුවත්, මේ සම්බන්ධයෙන් ඉලක්කයන් හඳුනාගෙන එය සාක්ෂාත් කර ගැනීමට සභාව විසින් කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ සභාවේ ඉදිරිපස කාර්යාලය ස්ථාපිත කිරීම වෙනුවෙන් පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය සහ සභාව විසින් රු. 300,000ක ප්‍රතිපාදන සළසා තිබූ නමුත් 2018 සැප්තැම්බර් 10 දින වන විටත් ඉදිරිපස කාර්යාලය ස්ථාපිත කර නොතිබූ අතර ඒ සඳහා ලබාගෙන තිබූ පරිගනක 02 නිෂ්කාර්යව පැවතුණි.

(ආ) නින්දවූර් පොදු වෙළෙඳපොලේ කඩකාමර 27ක් සහ විවෘත මාළු වෙළෙඳසැලක් ද පැවති නමුත් වර්ෂ හතරකට අධික කාලයක සිට කඩකාමර 14ක් සහ මාළු වෙළෙඳ සැල භාවිතයකින් තොරව පැවති බව නිරීක්ෂණය විය.

(ඇ) පොදු වෙළෙඳ පොලේ කඩකාමර 06ක් කුලියට ලබාදී තිබූ කඩකුලී හිමියන්ගෙන් රු.215,000ක කුලී මුදල් අයකර ගෙන නොතිබූ අතර එම කඩ කාමර සඳහා විදුලිය ගාස්තු රු 106,899ක්ද හිඟහිටව පැවතුණි. එසේ වුවත්, සභාව විසින් කඩකුලී හිමියන් සමග ගිවිසුම්වලට එළැඹ නොතිබුණි.

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ අනියම්, තාවකාලික පදනමින් කටයුතු කිරීම වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් සභාව වෙත ස්ථිර වශයෙන් පත්කරනු ලැබූ කම්කරු 2014 ඔක්තෝබර් 24 දින සිට මේ දක්වා අම්පාර ප්‍රාදේශීය සභකාර පළාත් ආණ්ඩුකාර කාර්යාලයේ සේවය කරමින් පැවති අතර එම සේවකයාගේ ජීව දත්ත තොරතුරු පමණක් සභාව විසින් පවත්වාගෙන එනු ලබන අතර ඔහුගේ පැමිණීම සනාථ නොකර සභාව විසින් මාස 46කට අධික කාලයක් සඳහා වැටුප් සහ වැටුප් වර්ධක ලබාදී තිබුණි.

(ආ) ප්‍රාදේශීය සභාව විසින් ලැයිස්තු නොකළ තනතුරු සඳහා නැගෙනහිර පළාත් පාලන ආණ්ඩුකාරවරයා විසින් වැඩබලන, අනියම්, කොන්ත්‍රාත් සහ තාවකාලික පදනමින් 2015 වර්ෂයේ සේවකයින් 14 දෙනෙකු සෞඛ්‍ය සේවක හා කම්කරුවන් ලෙස මාස 06ක කාලපරිච්ඡේදයක් සඳහා බඳවාගෙන තිබූ අතර අදාල කාල පරිච්ඡේදය අවසන්ව තිබූ නමුත් වර්ෂ 02කට අධික කාලයක් ගතවී තිබුණත් අනුමැතියකින් තොරව සභාවේ සේවය කර තිබුණි.

**4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

-------------------------------------

**4.1 නිරවුල් නොකළ විගණන ඡේද**

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාවේ පැරණි කාර්යාල ගොඩනැගිල්ල 2015 ජුනි 30 දින සිට සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යවරයාගේ ප්‍රාදේශීය කාර්යාලයට රු.15,000 ක් වන මාසික කුලියකට ලබා දී තිබුණත්, සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් හිඟහිටව පැවති මාස 39ක් දක්වා කුලී රු.585,000 ක් සහ විදුලිය ගාස්තු හිඟ රු. 8,302ක් අදාල අමාත්‍යාංශයෙන් මේ දක්වා අයකර ගෙන නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ සිට 2017 වර්ෂ අවසානය දක්වා සභාවේ JCB වාහනය ක්ෂේත්‍ර වැඩ සඳහා පුද්ගලික පාර්ශවයට කුලියට ලබාදීමෙන් ලැබිය යුතු රු.530,820 ක කුලිය අයකර ගැනීමට හෝ නැතහොත් අදාල පුද්ගලයන්ට එරෙහිව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමට මේ දක්වා කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 වර්ෂයේදී පළාත් සභාවට වෙන්කරනු ලැබූ සංවර්ධන සහනාධාර යටතේ සභාව විසින් මිලදී ගනු ලැබූ රු.299,965 ක් වටිනා කසළ එකතු කිරීමේ මළු 35,290 කින් මළු 33,800 ක් ගබඩාවේ අදාළ අවශ්‍යතාවය සඳහා භාවිතා නොකර 2018 සැප්තැම්බර් 06 දින දක්වා ගබඩාගත කර තිබුණි.

(ඇ) 2016 වර්ෂයේ ප්‍රාදේශීය සභා ශක්තිමත් කිරීමේ වැඩසටහන යටතේ ළමා උද්‍යානයට සහ වාහන නැවතුම්පොළට තණකොළ සිටුවීමේ කාර්යයන් සම්පූර්ණ කර ඇති බවට ලේඛන සකස්කර තාක්ෂණික නිලධාරී විසින් සහතික කර ඒ සඳහා රු.144,300 ක මුදලක් පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයෙන් ලබාගෙන තිබූ නමුත් අදාළ කාර්යය ආරම්භ කර නොතිබූ අතර මෙම කාර්යය වෙනුවෙන් කම්කරු කුලී ලෙස රු. 18,900ක් ගෙවීම් කර තිබුණි.

## 5. පද්ධති හා පාලන

පහත දැක්වෙන එක් එක් ක්ෂේත්‍ර හා ඒ ඉදිරියේ දක්වා ඇති කරුණු කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කළ යුතුව ඇත.

| | පාලන ක්ෂේත්‍රය | අවධානය යොමු කළ යුතු කරුණු |
|---|---|---|
| (අ) | ස්ථාවර වත්කම් පාලනය | (i) ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගැනීම.<br>(ii) නිෂ්කාර්යව පවතින වත්කම් ප්‍රයෝජනයට ගැනීමට කටයුතු කිරීම. |
| (ආ) | ආදායම් අයකිරීම් කළමනාකරණය | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කිරීම. |
| (ඇ) | ඝන අපද්‍රව්‍ය කළමනාකරණය | අපද්‍රව්‍ය වෙන්කර එකතු කිරීම |